# පාවහන් අඩි නිෂ්පාදනය

මාලනී මංගලිකා මෙන්ඩිස්
සහකාර තාක්ෂණඥ
රබර් භාණ්ඩ සංවර්ධන හා සේවා මධ්‍යස්ථානය

## හැඳින්වීම

පාවහන් කර්මාන්තය අප රටේ ඉතා සාර්ථකව කරගෙන යනු ලබන කර්මාන්තයකි. මෙය ඉතා තරඟකාරී තත්ත්වයක පවතින්නේ විදේශීය වෙළඳපොළෙන් මෙරටට ආනයනය කරන භාණ්ඩ නිසාය. සපත්තු කර්මාන්තය විශාල හෝ මධ්‍යම පරිමාණයෙන් පවත්වාගෙන යා හැකි කර්මාන්තයකි. එය සුළු පරිමාණයේ කර්මාන්තකරුවන්ට කළ නොහැක්කේ ඒ සඳහා විශාල ආයෝජනයක් කළ යුතු බැවිනි. එනම් ඒ සඳහා යෙදෙන යන්ත්‍ර සූත්‍ර ඉතා මිළ අධික ඒවා නිසාය. මධ්‍යම හා කුඩා පරිමාණයේ කර්මාන්තකරුවන් පාවහන් කොටස් වෙන් වශයෙන් මිළදී ගෙන නිමි භාණ්ඩය සාදනු ලබයි. මෙහිදී විශාලතම ආයෝජනය කළ යුතු වන්නේ පාවහන් අඩිය නිෂ්පාදනය සඳහාය.

## පාවහන් අඩි වර්ග කිහිප ආකාරයකට දැකිය හැක

- ස්වභාවික රබර් භාවිතයෙන්
- කෘතිම රබර් භාවිතයෙන්
- රෙවා වැනි තර්මොප්ලාස්ටික් වර්ග
- පී.වී.සී. වැනි ප්ලාස්ටික් වර්ග

## ස්වභාවික රබර් භාවිතයෙන් පාවහන් අඩි නිෂ්පාදනය

පාවහන් කර්මාන්තයේ යෙදී සිටින්නන් හට අච්චුගතව සාදා ගන්නා ලද අඩි 4 x 4 රබර් ෂීට් පාවහන් අඩියේ හැඩයට අච්චු මගින් කපාගැනීමෙන් හෝ රබර් සංයෝග තනි අඩි ලෙස අච්චුගතකර ලබාගන්නා සපත්තු අඩි ඒකක (unit sole) ලෙස වෙළඳපොළෙන් මිලදී ගත හැක. රෙසින වර්ගයක් වන හයි ස්ටයිරීන් රෙසින් (high styrin resin) යෙදූ රබර් අඩිය ඉතා සැහැල්ලු බවකින් හා මනා පෙනුමකින් යුක්ත වන අතර පාවහන් අඩිවලින් බලාපොරොත්තු වන ගුණාංග වන දෘඪ බව කැටිකොටගත් නැවෙන සුලු බවෙන්ද යුක්ත වේ. එමනිසා විලාසිතා සපත්තු නිෂ්පාදනයේදී මෙම අඩි සඳහා වැඩි ඉල්ලුමක් පවතී.

## කුඩා ශෛල වැනි සිදුරු සහිත රබර් ෂීට් (Microcellular Sheet)

පාවහන් අඩි සඳහා භාවිතා කරන නවත් රබර් අඩි වර්ගයකි. රබර් ෂීට් නිෂ්පාදන සංයෝගයට පිම්බුම්කාරක (blowing agent) යොදා මෙම ෂීට් නිෂ්පාදනය කරනු ලැබේ. පිම්බුම් කාරකය මගින් පිටවන නයිට්‍රජන් වායුව මගින් සංයෝගයෙන් වාත ස්ථර සෑදීම නිසා රබර් අඩියට සැහැල්ලු බව ලැබේ.

ස්වභාවික රබර් (R.S.S.) හා රසායන ද්‍රව්‍ය ද්විරෝල් යන්ත්‍රයක ආධාරයෙන් අඹරාගනු ලැබේ. පාවහන් අඩි නිෂ්පාදනයේදී ප්‍රධාන අමුද්‍රව්‍ය වන්නේ මෙම රබර් සංයෝගයයි. ඉන්පසු නියමිත අච්චුවට රබර් සංයෝග පුරවා හයිඩ්‍රොලික් ප්‍රෙස් එකක ආධාරයෙන් ප්‍රෙස් කරනු ලැබේ. ඉන්පසු අනවශ්‍ය රබර් කොටස් කපා නියමිත පරිදි නිමකරනු ලැබේ.

## යන්ත්‍රෝපකරණ

- ද්වි රෝල් යන්ත්‍රය (26" x 14") - 16,00000/-
- හයිඩ්‍රොලික් ප්‍රෙස් යන්ත්‍රය (1' x 1') - 5,00000/-
- නියමිත ප්‍රමාණය සඳහා අච්චු - 75000/-
- භාණ්ඩ නිම කිරීම සඳහා කතුර සහ අන් මෙස් වැනි දෑ - 2000/-

## පාවහන් අඩි සඳහා රසායන ද්‍රව්‍ය වට්ටෝරුව

| | | |
|---|---|---|
| රබර් (R.S.S.) | - | 100 |
| සින්ක් ඔක්සයිඩ් | - | 05 |
| ස්ටියරික් ඇසිඩ් | - | 1.5 |
| කාබන් බ්ලැක් | - | 30 |
| චයිනා ක්ලේ | - | 80 |
| ප්‍රෝසස් ඔයිල් | - | 05 |
| පී.ටී. කිරි | - | 1.5 |
| පැරපින් වැක්ස් | - | 0.5 |
| එම්.බී ටී එස්. | - | 1.5 |
| ටී.එම්.ටී.ඩී. | - | 0.2 |
| සල්ෆර් | - | 2.5 |

මෙම රබර් සංයෝගය ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් ලබාගත හැකිවේ.

### නිෂ්පාදන ක්‍රියාවලිය

රබර් සහ රසායන ද්‍රව්‍ය

↓

අච්චු රෝල යන්ත්‍රයෙන් ඇඹරීම

↓

රබර් සංයෝගය

↓

අවශ්‍ය ප්‍රමාණයට කැපීම

↓

අච්චුව තුල තැන්පත් කිරීම

↓

ප්‍රෙස් කිරීම

↓

අනවශ්‍ය කොටස් සපා හැරීම

↓

නිමි භාණ්ඩය

කෘත්‍රිම රබර් මගින් සපත්තු අඩි නිෂ්පාදනයේදීද ඉහත සඳහන් ක්‍රමයම අනුගමනය කරනු ලැබේ.

ඊවා යන රසායන ද්‍රව්‍ය තර්මොප්ලාස්ටික් වර්ගයට අයත්ය. එමගින් පාවහන් අඩි නිෂ්පාදනයේදී ඊවා සහ ස්වභාවික රබර් මිශ්‍ර කරනු ලැබේ. මෙම සංයෝග සඳහා පිපුම් කාරකයක් (බ්ලෝවින් ඒජන්ට්) යොදනු ලැබේ. මෙහි නිෂ්පාදන ක්‍රියාවලිය ඉහත සඳහන් ආකාරයටම සමාන වේ. මෙහි විශේෂයක් වන්නේ මෙම අඩිය ඉතා සැහැල්ලු බවකින් යුක්තවීමයි. මෙය පාවහන් අඩියක් වශයෙන් නිෂ්පාදනය නොකරනු ලබන අතර 4' x 4' පමණ ප්‍රමාණයේ ෂීට් වශයෙන් නිපදවනු ලැබේ. ඉන්පසු අවශ්‍ය ප්‍රමාණයට අඩි කැපීමේ යන්ත්‍රයක් භාවිතා කිරීමෙන් කපනු ලැබේ.

පී.වී.සී. වැනි ප්ලාස්ටික් වර්ග භාවිතා කර ඉන්ජෙක්ෂන් මෝල්ඩින් යන්ත්‍රයක් මගින් තනි අඩි ඒකක වශයෙන් පාවහන් අඩි නිෂ්පාදනය ලබාගත හැක.

### ආයෝජනය

| | රුපියල් |
|---|---|
| යන්ත්‍රෝපකරණ සඳහා | 2177000/- |
| ජල විදුලි සැපයීම සඳහා | 25000/- |
| අනෙකුත් වියදම් 5% | 150000/- |
| මුලු වියදම් | 2352000/- |
| කාරක ප්‍රාග්ධනය (working capital) | 365000/- |
| මුලු ආයෝජනය | 2717000/- |

මෙම භාණ්ඩ නිෂ්පාදන තාක්ෂණ පහසුකම් සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ පෑලියගොඩ පිහිටි රබර් භාණ්ඩ සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයෙන් විමසන්න. විමසීම් - දූරකථන: 011-2930746


## කාන්තා පාවහන් නිෂ්පාදනය

**අන්තර්ගතය**

තාක්ෂණය,
නිෂ්පාදන ක්‍රියාවලිය
යන්ත්‍ර හා උපකරණ
අමුද්‍රව්‍ය
ඇසුරුම්කරණය
වෙළඳපොළ
තාක්ෂණ උපදේශක සේවා
මූල්‍ය පහසුකම් ලබාගැනීම
සංවිධානය හා කළමනාකරණය

කා.ස.ම. ස්වයං රැකියා අත් පොතකි
මිළ රු. 100/-